

# නෑනා - මස්සිනාලා ගේ විවාහය අසුබද?

"අපි හැමෝම ඇත්තටම
නෑනලා - මස්සිනාලා වෙමු
මා විශ්වාස කරන්නේ එහෙමයි!
මන්ද යත්,
අප **ආදම්** ගේ සහ **ඒවා** ගේ
දරුවන් වන නිසයි!
එහෙමනම් අප සිප වැළඳ ගන්නා විට
එය හොඳ නොවන්නේ කෙලෙස ද?
(- **එල්විස් ප්‍රෙස්ලි** ගේ ගීයක් 1964)

**සිරිල් අභයගුණවර්ධන**

එහෙත් ඔවුන් අපහාසයට හා විහිළුවට පහසුවෙන් ගොදුරු වූ අතර, දැඩි නීති-රීතිවල ඍජු එල්ලයක් ද වී තිබේ. එසේ වුවද පර්යේෂණාත්මක අධ්‍යයනයන් ගෙන් පෙන්නුම් කෙරෙන්නේ, ඔවුන් ගේ පවුල් ජීවිතය තුළ සුවිශේෂී අවධානමක් නොමැති බවයි. මේ අනුව, අවශ්‍ය වූ විටෙක පවුලේ අය පිළිබඳ පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට අමතරව, ලේ නෑකම මත පදනම් වූ **ප්‍රවේණි විද්‍යාත්මක** නිරීක්ෂණ අවශ්‍ය නොවන බව අනාවරණය වී තිබේ.

මෙම වෙනස්වීම ඇරැඹුණේ එක්තරා **නෑනා** කෙනකු හා **මස්සිනා** කෙනකු එකතු වී එකට උයාපිහා ගෙන, පවුල් කන්නට පටන් ගැනීමත් සමඟයි. මෙහි කතානායකයා වූ **පෝල් ගොන්සාලේස්** ඔහුගේ නෑනා වූ **ඩෝනා** කැඳවාගෙන පැමිණියේ කොලොම්බියාවේ ඈත ගම්මානයක සිට කරත්ත පාරක, දුරකතරක් ගෙවා ගෙනයි. මේ නිසා මෙදින ඔවුනට සිය පාතරාසය හා දහවල් ආහාරයද අහිමි විය.

එවේලේ ඔවුන් අත පැවැතියේ විස්කි බෝතලයක් (JONNIE WALKER BLACK LABLE) හා එලවළු අච්චාරුවක් පමණි. සඳ ඇති රැයක් වූ එදින ඔවුන්ට නිදන්නට සිදුවූයේද එල්ලන ලද ඇඳන්(HAMMOCKS) වලයි. පුරා සොළොස් වසරක් තිස්සේ හැදී වැඩුණු ඔවුන්ගේ ආදර වෘක්ෂයේ මල්පල හටගැනුණේ මෙලෙසිනි. මෙදින එකට එකතු වූ ඒ දෙපොළ විසින්, පසු දවසක දී දෙවරකට, ළමයින් දෙදෙනකු සමාජයට දායාද කරන ලදී.

"මගේ අවැස්ස නෑනා සමඟ ප්‍රේම සම්බන්ධයක් ඇතිවීම ගැන මුලින්ම මාතුළ ඇතිවූයේ තිගැස්මකි. අනතුරුව එම ආශ්චර්යය මාවෙත පැමිණීම ගැන මම පුදුමයටත් සංතෝසයටත් පත්වූයෙමි" යයි **පෝල්** පැවැසීය. "එහෙත් ඇත්තටම මගේ එකම අරමුණ වූයේ මේ තුළින් **අලුත් වෛද්‍ය මතයක්** (ANEW MEDICAL ISSUE) ඇතිකිරීමයි.

**පෝල් ගොන්සාලේස්** NEWYORK CITY සරසවියේ උපාධි අපේක්ෂකයකු වූ අතර, **ඩෝනා** මූල්‍යායතනයක උපදේශිකාවක් වූවාය. ඔවුහු දිගු කාලයක සිට පවත්වා ගෙන ආ ආදර සම්බන්ධය සමෘද්ධිමත් කර ගැනීමට සමත් වූ නෑනා මස්සිනා යුවළක් ලෙස ප්‍රකට වූහ. මීට බොහෝ කාලයකට පෙර පරිණාමවාදයේ පියා හැටියට පසිද්ධියට පත් වූ චාර්ල්ස් ඩාවින් විවාහ වී ඇත්තේ ද ස්වකීය ඇවැස්ස නෑනා වූ එමා සමඟිනි. එසේම ගුරුත්වාකර්ෂණ බලය ලොවට හඳුන්වා දී එමඟින් කීර්තියට පත් වූ ඇල්බට් අයින්ස්ටයින් ද විවාහ වූයේ එල්සා නම් වූ ඔහුගේ නෑනා සමඟ යි. "මම කළෙත් ඒකමයි" පැවසුවේ වික්ටෝරියා මහ රැජින යි. මෙලෙස ලෝකය පුරා ලක්ෂ සංඛ්‍යාත නෑනා - මස්සිනාවරු එකට පවුල් කෑහ. දැනුදු පවුල් කති.

එසේ වුවද මෙකී සමාජ භාවිතය, එක්සත් ජනපදය තුළ සැලකෙන්නේ නොකටයුතු "කැළලක්"(stigma)ලෙසිනි. ඔවුන්නගේ පිළිගැනීම අනුව උපතින් ම පවුලේ ළඟ නෑයන් වන අය සමඟ සංවාසයේ යෙදීම ව්‍යාභිචාරය(incest-impure)කි.මෙම තහනම හුදෙක් සමාජමය තහංචියක් පමණක් නොවේ. එය ව්‍යවස්ථානුකූල නීතියක් ද වේ. ඉංග්‍රීසි සමාජයේ මෙය හැඳින්වෙන්නේ "පෙරීලී ලෙවිස් සහලක්ෂණය" යනුවෙනි. මේ අනුව රාජ්‍ය 24ක ඇවැස්ස නෑනලා-මස්සිනාලා අතර විවාහය නීතියෙන් තහනම් කර ඇත. අනෙක් රාජ්‍ය පහ විසින් දරුවන් නොලැබෙන නෑනලා මස්සිනාලාට පමණක් විවාහ වීමේ අවසරය තහවුරු කර තිබේ. මෙකී තහනම කෙරෙහි බලපා තිබෙන ප්‍රධාන කාරණය වන්නේ මෙවැනි විවාහවලින් ලැබෙන දරුවන් බොහෝවිට බරපතළ "ආජන්මජ රෝගවලට"(serious cogenital illnesses)ඉතා පහසුවෙන් ගොදුරු වෙතැයි පවතින ඛේදජනක විශ්වාසය යි.

එහෙත් දැන් මෙම පිළිගැනීම වෙනස් කිරීමට කාලය පැමිණ තිබේ. මේ පිළිබඳ සිදු කරන ලද විස්තීර්ණ අධ්‍යයනයක සම්පූර්ණ තොරතුරු, ප්‍රවේණි විද්‍යාව හා සම්බන්ධ උපදේශන සඟරාවකින් හෙළිදරව් කර තිබේ. එමඟින් පෙන්වා දී තිබෙන ආකාරයට, උපතේ දී ම සිදුවන හෘදයාබාධවල සහ තන්තුමට ආබාධවල සාමාන්‍ය ප්‍රතිශතය සියයට 3 ක් හෝ 4 ක් හෝ පමණි. මේ අනුව ඉහත කී පරීක්ෂණය සඳහා මූල්‍යමය දායකත්වය සැපයූ, ප්‍රවේණි විද්‍යාඥයන් ගේ ජාතික උපදේශක සංගමයේ සභාපති, රොබින් බෙනට් මෙසේ කියා තිබේ. "......මේ නිසා මෙවැනි අවස්ථාවක පවුලේ අය පිළිබඳ විධිමත් වෛද්‍ය පරීක්ෂණයක් කිරීම මැනවි. ඒ හැර ඊට අමතරව, ලේ නෑකම ගැන, ප්‍රවේණි විද්‍යාත්මක පරීක්ෂණයක් සිදු කිරීම කිසිසේත් ම අවශ්‍ය නොවේ."

මෙකී අධ්‍යයන වාර්තාව ප්‍රසිද්ධ වීමත් සමඟ ජනතාව විචිත්‍ර ලෙස දැනුවත් වූවා පමණක් නොව, මෙතෙක් "නෑනා මස්සිනා විවාහක ජෝඩු දරුවන් ලැබීම අපේක්ෂා නොකළ යුතුය" යන ස්ථාවරයේ සිටි වෛද්‍යවරුන් තුළ පවා අලුත් පිබිදීමක් වැඩෙන්නට විය. මෙහි දී බෙනට් මෙසේ ද ප්‍රකාශ කළේ ය." හරියට ම මේ සතියේ දි මට 23 හැවිරිදි විවාහක කාන්තාවක් හමු වුණා. මේ වන විට ඈ නළ දරුවකු ලබා ගැනීම සඳහා එකඟත්වයකට පැමිණ සිටියා. ඈ එසේ කර තිබුණේ, ඇගේ දෙමවුපියන්, නෑනා හා මස්සිනා වන බව දැනගැනීමත්, ඒ හේතුව මත ම ඇය දරුවන් නොලැබිය යුතු යැයි වෛද්‍ය උපදෙස් ලැබී තිබුණාණු නිසාත් ය."

ඉහත පරීක්ෂණ වාර්තාව, "ඇමී" නැමැත්තියකගේ උදාහරණය ද අවධාරණාත්මකව ඉදිරිපත් කර තිබේ. ඇමී, සිය මස්සිනා සමඟ දෙවසරක සිට ම එකට පවුල් කන තැනැත්තියකි. එම විවාහයේ දෙවැනි වසර වූ 1996 දී ඕ ගැබිනියක වූවා ය.

මෙහි දී ඇගේ වෛද්‍යවරු, "ගබ්සාවක්" කරගන්නා ලෙස ඇයට උපදෙස් දුන්හ. කෙසේ වුවද මේ ගැන වැඩිදුර තොරතුරු දැන ගැනීමේ අපේක්ෂාවෙන් ඕ තවදුරටත් සොයා බැලීමේදී මෙම වාර්තාවද කියවන්නට ලැබී තිබේ. අනතුරුව ඈ තමන්ට දී තිබූ වෛද්‍ය උපදෙස් නොතකා හැරියා ය. ඒ අනුව ඕ ඊළඟ සතියේ දී අන්තර්ජාලයීය

මීට බොහෝ කාලයකට පෙර පරිණාමවාදයේ පියා හැටියට පසිද්ධියට පත් වූ චාර්ල්ස් ඩාවින් විවාහ වී ඇත්තේ ද ස්වකීය ඇවැස්ස නෑනා වූ එමා සමඟිනි. එසේම ගුරුත්වාකර්ෂණ බලය ලොවට හඳුන්වා දී එමඟින් කීර්තියට පත් වූ ඇල්බට් අයින්ස්ටයින් ද විවාහ වූයේ එල්සා නම් වූ ඔහුගේ නෑනා සමඟ යි. "මම කළෙත් ඒකමයි" පැවසුවේ වික්ටෝරියා මහ රැජින යි. මෙලෙස ලෝකය පුරා ලක්ෂ සංඛ්‍යාත නෑනා - මස්සිනාවරු එකට පවුල් කෑහ.

වෙබ් අඩවියකින් සියලු නෑනාවරුන් හා මස්සිනාවරුන් අමතා ලියා දැන්වූයේ, තමා මෙම වාර්තාවේ පිටපත් කීපයක් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බවත්, එයින් එකක් තමා විසින්ම සිය නාරිදේහ විද්‍යා . වෛද්‍යවරයා (GYNECOLOGIST)වෙත තැපෑලෙන් යවන බවත් ය.

නෑනා, මස්සිනාලාගේ පවුල් කෑමට එරෙහිව ඇමරිකානු තහනම වැඩෙන්නට වූයේ 19 වන ශතවර්ෂයේ සිටයි. ඊට පදනම වැටුණේ කාන්තාර වාසී පදිංචිකරුවන්ට වඩා වනචාරී (SAVAGE)ඉන්දියානුවන් උසස් යැයි ඔවුන් සිතීම නිසා යැයි මාර්ටින් ඔටෙන් හෙයිවර් පවසයි.

හෙතෙම "තහනම් නෑයෝ"(FORBIDDEN RELATIAES)නම් වූ ග්‍රන්ථයේ කතුවරයා වෙයි. එය, නෑනලා මස්සිනාලාගේ විවාහය පිළිබඳව ඇමරිකානුවන් තුළ පවතින මිත්‍යා විශ්වාසය (THE AMERICAN MVTH OF COUSIN MARRIAGE) විශද කරන විචාරාත්මක කෘතියකි.

"මෙහි සැබෑ සත්‍යය වන්නේ, සංක්‍රාමික යුරෝපීයයන් නෑනා, මස්සිනා විවාහය අනුමත කරන අතර, ස්වදේශීය ඇමරිකානුවන් එය පිළිකෙව් කිරීම යයි ඔටෙන් හෙයිවර් වැඩිදුරටත් පෙන්වා දෙයි.

**නෑනා, මස්සිනාලාගේ පවුල් කෑමට එරෙහිව ඇමරිකානු තහනම වැඩෙන්නට වූයේ 19 වන ශතවර්ෂයේ සිටයි. ඊට පදනම වැටුණේ කාන්තාර වාසී පදිංචිකරුවන්ට වඩා වනචාරී (SAVAGE) ඉන්දියානුවන් උසස් යැයි ඔවුන් සිතීම නිසා යැයි මාර්ටින් ඔටෙන් හෙයිවර් පවසයි. හෙතෙම "තහනම් නෑයෝ" (FORBIDDEN RELATIAES) නම් වූ ග්‍රන්ථයේ කතුවරයා වෙයි.**

මේ විෂය පිළිබඳ "දෙවියන් වහන්සේ" පැහැදිලි යමක් පවසා නැද්ද? නෙවාඩා (NEVADA)හි 37 හැවිරිදි ලේඛිකාවක වන ක්‍රිස්ටිස්මිත් මේ පැනයට පිළිසෙන්නේ මෙලෙසිනි. ඇගේ ඇවැස්ස මස්සිනාගේ පුත් මාර්ක් සමඟ ප්‍රේමයෙන් වෙළුණු මුල් අවදියේ, ඈ තුළ වරදකාරී හැඟීමක් (GUILTY CONSCIOUS) ඇති වූයේ යැයි ක්‍රිස්ටි සඳහන් කර තිබේ. "මෙම පීඩාකාරී හැඟීමෙන් සිත නිදහස් කර ගැනීම සඳහා මම උදක්ම වෙහෙසුණෙමි" යැයි ඕ වැඩිදුරටත් ලියා ඇත.

"ඒ අනුව මා වැරැදි දැයි සොයා දැනගැනීම සඳහා" "බයිබලය" පෙරළා ඉවසීමෙන් යුතුව මම එය කියවන්නට වූයෙමි. එහෙත් එමගින් මා සොයා ගත්තේ, මා බලාපොරොත්තු වූ කාරණයට ඉඳුරා පටහැණි කාරණා රැසකි. කෙටියෙන් පවසන්නේ නම් "බයිබලය" මෙබඳු සබඳතාවයන්ට අනපේක්ෂිත අනුග්‍රහයක් දක්වා තිබේ.

බයිබලයට අනුව ගෝත්‍රික ප්‍රධානියකු (PATRIARCH)වූ ජේකොබ් ඔහුගේ ඇවැස්ස නෑනලා දෙදෙනකුට විවාහ කර ගෙන ඇත. ඔවුහු රචෙල් (RECHEL)හා "ලී" (LEAH) නම් වූහ. එසේම අයිසැක් හා රෙබෙකා ද එකිනෙකාට, නෑනා හා මස්සිනා විය. එහෙත් පූජකයින් විසින් පසුව මේ දෙන්නා වෙන් කැරැවූහ. රෝමානු කතෝලික පල්ලිය, නෑනා හා මස්සිනා විවාහයට සහශ්‍රයකටත් වැඩිකාලයක සිට ම විරුද්ධ වූ අතර, එවැන්නකට "දේව වසරය" (DISPENSATION)ලබා දුන්නේ "යෝග්‍යය" (WORYHY)යැයි පිළිගැනුණු විටෙක පමණි.

බයිබලයෙන් ආත්මශක්තිය ලැබූ ක්‍රිස්ටි ස්මිත්, 1999 වසරේදී මාර්ක් සමඟ විවාහ වූවා ය. එපමණක් නොව, ඒ අවුරුද්දේදීම ඕ මෙකී නීතියට හා තහංචියට එරෙහිව සටන් කිරීම සඳහා සංවිධානයක් ද පිහිටුවා ගැනීමට සමත් වූවා ය. එම සංවිධානය නම්, "තුරුළු කරගන්නවා" යන අරුත නඟන(CUDDLE) වීය.

මේ නම සෑදී තිබෙන්නේ ඒ පිළිබඳ සම්පූර්ණ නාමයේ මුල් අකුරු එකට එක්කිරීමෙනි. එකී නම තුළින්ම එහි පරමාර්ථය හෙවත් අරමුණ ද ගම්‍යමාන වේ.

(COUSINS UNITED TO DEFEAT DISCRIMINATING LAWS THROUGH EDUCATION)යනු එම සංවිධානය වේ. "අධ්‍යාපනය මඟින් අසාධාරණ නීති පරාජය කිරීම උදෙසා එක්සත් වූ නෑනලා හා මස්සිනාලා" යනු එහි සරල සිංහල තේරුමයි.

පූර්වෝක්ත පෝල් සහ ඩෝනා ගොන්සාලේස් පවුල් ඉතාමත්ම ප්‍රීතියෙන් ජීවත් වෙති. ඔවුන්ගේ 9 හැවිරිදි පුතාත් 8 හැවිරිදි දියණියත් මනාව වැඩී දැන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු ද හොඳින් කරගෙන යති. පවුලේ රහස තවමත් රැකගෙන සිටීමට මව හා පියා සමත්ව සිටී. (මෙම කතාව සඳහා ඔවුන්ගේ සැබෑ නම් යෙදීම ගැන ඔවුන් තුළ මනාපයක් නොවීය) පවුලේ රහස ගැන මව මෙසේ කීවා ය.

"අපේ ළමයි මෙහේ පාසල් යන්නට පටන්ගත්තට පස්සෙ මම ඔවුන්ට කීවේ, මේ කාරණය කාගෙන්වත් හංගන්න වුවමනා නැහැ. ඒවුණත් ඒක ප්‍රචාරය කරන්න මහන්සිවෙන්න එපා කියලයි!" මෙයින් පසුව වෛද්‍ය තහනම ඉවත්කරන ලදී. එසේම සමාජ තහංචියද කාලයාගේ ඇවෑමෙන් වියැකී යනු ඇත.

(TIME) **සඟරාව ඇසුරෙනි)**

